# අයදුම්පත්‍රය පිරවීම සහ ජල සම්බන්ධනය ලබාගැනීම පිණිස උපදෙස්

## A. අයදුම්පත්‍රය පිරවීමේදී පහත උපදෙස් අනුගමනය කරන මෙන් කාරුණිකව ඉල්ලමු

1. අයදුම්කරුගේ නම සිංහල හෝ දෙමළ සහ ඉංග්‍රීසියෙන් (කැපිටල් අකුරින්) පැහැදිලිව ලියන්න.

    1.1 ගෘහ නොවන ජල සම්බන්ධන වලදී පහත පරිදි සම්පූර්ණ කරන්න

උදාහරණ-

| | |
|---|---|
| DIRECTOR<br>A.B AND COMPANY LTD | සීමාසහිත හෝ සීමාසහිත නොවන සමාගමක් නම් |
| OFFICER IN CHARGE<br>POLICE STATION | රජයේ ආයතන |
| A.C.DE SILVA<br>CHANDRA HOTEL | ඒක පුද්ගල හෝ හවුල් ව්‍යාපාර |

2. ජල සම්බන්ධනය අවශ්‍ය කරන ස්ථානයේ ලිපිනය නිවැරිදිව සටහන් කරන්න
3. ලිපි යැවිය යුතු ස්ථානය නිවැරිදිව සටහන් කරන්න
4. අයදුම්කරු ජල සම්බන්ධනය අවශ්‍ය ස්ථානයේ නීත්‍යානුකූල අයිතිකරු නොවේනම් අයිතිකරුගේ නම සහ පදිංචි ලිපිනය සඳහන් කරන්න
5. ජල සම්බන්ධනය අවශ්‍ය කරන ස්ථානයේ වරිපනම් සහතිකය ඉදිරිපත් කරන්නේ නම් වරිපනම් සහතිකය ඉදිරිපත් කරමි යනුවෙන් සඳහන් කරන්න. වරිපනම් සහතිකය නොමැතිනම් ගෘහමූලික සහතිකය, ග්‍රාම නිළධාරී පදිංචිය සහතික කල සහතිකය ඉදිරිපත් කරමි. යනුවෙන් සඳහන් කරන්න (අදාල වචන ඉතිරිකර, අනවශ්‍ය වචන කපා හරින්න). වරිපනම් සහතිකයේ පිටපත/ ගෘහමූලික සහතිකය, ග්‍රාම නිළධාරී පදිංචිය සහතික කළ සහතිකය අයදුම්පත සමග ඉදිරිපත් කල යුතුය.
6. අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කරන්න. ජාතික හැඳුනුම්පත් අංකය නොමැති විට විදේශ ගමන් බලපත්‍රයේ හෝ රියදුරු බලපත්‍රයේ අංකය සඳහන් කරන්න.
7. ජල සම්බන්ධනය අයදුම්කරන්නාගේ නිවසේ දුරකථන අංකය, ජංගම දුරකථන අංකය, ඊ මේල් ලිපිනය (තිබේනම් පමණක්) සඳහන් කරන්න.
8. අයදුම්කරු සමෘද්ධි ලාභියකු නම් සමෘද්ධි අංකය සහ දිනය සඳහන් කරන්න. සමෘද්ධි ලාභියකු බවට සහතික කිරීමට අදාළ ලිපිලේඛණ ඉදිරිපත් කළ යුතුය.
9. ජල සම්බන්ධනය ඉල්ලුම් කරන්නේ ප්‍රජාමූල සංවිධාන හා බද්ධවී ක්‍රියාත්මක වන ජල යෝජනා ක්‍රමයකින් නම් ඒ බව සඳහන් කර ප්‍රජාමූල සංවිධානයෙන් අනුමැතිය ලබාගත් ලිපිය ඉදිරිපත් කළ යුතුය.
10. ජල නල එලීම සඳහා කානු කපාදීම (ජල මණුව දක්වා) අයදුම්කරු සිදුකරන්නේද? එසේ නම් ඔව් යනුවෙන් සඳහන් කරන්න. (නැත යනුවෙන් සඳහන් කලවිට එය මණ්ඩලය විසින් සිදුකෙරේ)
11. එකතු කල අගය මත බදු (වැට්) බිල්පත් අවශ්‍යනම් අදාළ බදු අංක සඳහන් කර එහි ලියාපදිංචි සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතුය
12. ගෘහ ජල සම්බන්ධන හැර අනෙකුත් ජල සම්බන්ධන ලබාගැනීමේදී දිනකට අවශ්‍යවේයැයි සිතන ජල ප්‍රමාණය ලීටර් වලින් සඳහන් කරන්න.
13. ජල සම්බන්ධනය අයදුම් කරන්නේ ආයතනයකටද, ආගමික ස්ථානයකටද, කර්මාන්ත ශාලාවකටද යන්න පැහැදිලිව සටහන් කරන්න (ගෘහ නොවන ජල සම්බන්ධන ලබාගැනීමේදී)

***ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කර ජලසම්පාදන මණ්ඩලය වෙත භාරදී ලදුපත ලබාගැනීමට කටයුතු කරන්න***

-අනිත් පිට බලන්න

## B. ජල සම්බන්ධනය ලබාගැනීමේදී පහත උපදෙස් අනුගමනය කරන මෙන් කාරුණිකව ඉල්ලමු

1. ඔබගේ අයදුම්පත්‍රය අනුව මණ්ඩලයේ නිළධාරියෙකු අදාළ ස්ථානයට පැමිණ පරීක්ෂා කිරීමෙන් පසු ඇස්තමේන්තුවක් සහිත ගෙවීම්පත, ජල සම්බන්ධනය ලබාදීමේදී සිදුවන මාර්ගය පළුදුකිරීම සම්බන්ධ විස්තර ඇතුලත් පත්‍රිකාව, ජල සම්බන්ධනය ලබාගැනීමේදී මණ්ඩලය සමග එළඹිය යුතු ගිවිසුම ඔබවෙත ලබාදෙනු ඇත.

   - ජල සම්බන්ධනය ලබාගැනීම සඳහා මණ්ඩලය වෙත ගෙවිය යුතු මුදල අදාල වවුචරයේ සඳහන් ස්ථානයට ගෙවිය යුතුය.
   - මාර්ගය පළුදුකිරීම සම්බන්ධ විස්තර ඇතුලත් පත්‍රිකාව අදාළ මාර්ගය නඩත්තු කරන ආයතනය වෙත ඉදිරිපත් කර සිදුවන හානි සදහා ගෙවිය යුතු මුදල එම ආයතනය වෙත ගෙවිය යුතුය.

   ඉහත ගෙවීම් සිදුකර අදාළ ගෙවීම් පත්‍රිකා සහ මාර්ගය පළුදුකිරීම සඳහා අදාල මාර්ගය නඩත්තු කරන ආයතනය ලබාදුන් අවසර පත්‍රිකාව මණ්ඩලය වෙත (අදාළ කාර්යාලය වෙත) ඉදිරිපත් කළ යුතුය .

2. ජල සම්බන්ධනය ලබාගැනීමේදී මණ්ඩලය සමග එළඹිය යුතු ගිවිසුම සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු විසින් සහතික කොට අදාළ ස්ථානභාර නිළධාරී කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.

3. ජල සම්බන්ධනය ලබාගැනීමේදී ඇප මුදලක් තැන්පත් කළ යුතුය. (මෙම ඇප මුදල අයදුම්කරුට අවශ්‍ය විටක ගිණුම අවලංගු කර ආපසු ලබා ගත හැක). ඇප මුදල ඔබගේ සාමාන්‍ය මාසික ජල පරිභෝජන ප්‍රමාණය සඳහා අයකරන මුදල මෙන් තුන් ගුණයක්වේ.

4. ජල සම්බන්ධනය ලබා දෙනුයේ පිවිසුම් මාර්ගය ඔස්සේය. වෙනත් ඉඩමක් හරහා ලබානොදේ.

5. සාමාන්‍යයෙන් ජල සම්බන්ධන ලබාදෙනුයේ අඟල් ½ විශ්කම්භයෙන් යුතු නල මගින් වන අතර අයදුම්කරුගේ ඉල්ලීම සහ තාක්ෂණික හැකියාව මත අඟල් ¾ විශ්කම්භයෙන් යුතු නල මගින් ජල සම්බන්ධන ලබාදීමට සලකා බැලිය හැක.

6. සහාධිපත්‍ය නිවාස ඒකකයක (Condominiums) පදිංචි කරුවන් සදහා ගෘහ ජල සම්බන්ධන ලබාගැනීමේ ඉල්ලුම්පත්‍රය අදාල නොවේ.

7. සීමාසහිත/ සීමාසහිත නොවන සමාගම් වෙනුවෙන් ජල සම්බන්ධන ලබා ගැනීමේදී අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් ගිවිසුම අත්සන් කර නිල මුද්‍රාව සමග ඉදිරිපත් කළ යුතුය. හවුල් ව්‍යාපාරයක් හෝ ඒක පුද්ගල ව්‍යාපාරයක් නම් අයිතිකරු විසින් ගිවිසුම අත්සන් කළ යුතුය. ගිවිසුම අත්සන් කිරීමේදී සමාගම් ලියාපදිංචි කිරීමේ සහතිකය (Form 48) ඉදිරිපත් කළ යුතුය. රජයේ ආයතනයක් නම් බලයලත් නිළධාරියෙකු අත්සන් කළ යුතුය. බලය පැවරීමේ ලිපියද ඉදිරිපත් කළ යුතුය.

8. ජල සම්බන්ධනය ඉල්ලා සිටින්නේ ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්කරුනම් එම ඉල්ලීමට අදාළ ආයතනයේ ලිඛිත අනුමැතිය තිබිය යුතුය.

9. යම් හෙයකින් ඔබ විසින් ඉල්ලුම් කරන ලද ජල සම්බන්ධනය තාක්ෂණික හේතුවක් මත හෝ වෙනයම් හේතුවක් මත ලබා දිය නොහැකිනම් ඒ බව අයදුම්පත ලැබී දින 14 ක් ඇතුලත ඔබ වෙත දැනුම්දීමට කටයුතු කරනු ඇත.

10. මේ සම්බන්ධව ඔබට වෙනත් ගැටළුවක් වේනම් ලදුපතෙහි සඳහන් දුරකථන අංකයට අමතා වැඩි විස්තර දැනගැනීමට කාරුණික වන්න.